මව්බිම
2020/09/22
පිටු අංකය 05

# උද්ධමනය ඉහළ යයි

පහන් විජේසේකර

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් ජූලි මාසයේ පිළිබිඹු වූ යටිදැරි උද්ධමනය 4.5% සිට අගෝස්තු මාසය වන විට 4.6% දක්වා වැඩිවී ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනය කරයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සන්සන්දනය කළවිට 2020 ජූලි මාසයේ 137.3ක් වූ දර්ශකාංකය 2020 අගෝස්තු මාසයේ 137.8ක් දක්වා ඉහළ ගොස් ඇතැයිද එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

ආහාර කාණ්ඩය සැලකූවිට එළවළු, කහකුඩු, පොල්, ලොකු ලූනු, පලතුරු, බිත්තර, බිස්කට්, මයිසූර් පරිප්පු, පපඩම් සහ සහල්පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පොල්, සහල්, කහකුඩු, පොල්තෙල්, සීනි සහ අලුත් මාළු යන ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ මට්ටමක පැවැතීම 2019 අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 අගෝස්තු මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන හේතුවක් වී ඇතැයිද එම දෙපාර්තමේන්තුව වැඩිදුරටත් සඳහන් කරයි.